# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1986/30 - 2016 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2016.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2016 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව 2016.09.07 දින ලැබී ඇති හෙයින්, එම ප්‍රඥප්තිය 2016.09.07 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ථි මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාතේ 2016 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

***2014 අංක 04 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2016 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (අ) වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ආදායම් දිරි ගැන්වීමේ අරමුදල

102 (අ) මේ වගන්තියේ මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන ආදායම් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(ආ) එක් එක් වර්ෂ වෙනුවෙන් අරමුදලේ කාර්යය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන යම් මුදලක් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

දිරි දීමනාව උපයාගතයුතු ආකාරය

(ඇ) (i) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක සඳහන් විධිවිධානවලට අනුව යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු බවට නියම කර ඇති බද්දක්/ගාස්තුවක් නියමිත කාලසීමාව තුළ නොගෙවා ඇති විටකදී ආදායමක් රැස්කර ගනු ලැබ ඇති අවස්ථාවක, සහ/හෝ පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ ඉදිරිපත් කළ යුතු බවට එකී ප්‍රඥප්ති මගින් නියම කර ඇති වාර්තා නොසැපයීම සහ/හෝ යම් වාර්තාවක ප්‍රකාශ කර ඇති පිරිවැටුම, යම් සාධන පත්‍රයක ප්‍රකාශ කර ඇති වටිනාකම ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි පරීක්ෂා කිරීමේදී අසත්‍ය ලෙස ප්‍රකාශ කර ඇති බවට තහවුරුවීම යන කරුණු සැළකිල්ලට ගෙන තක්සේරුකරුවෙකු විසින් කරනු ලබන තක්සේරුවක් සහ/හෝ මත ප්‍රකාශයක් මගින් ආදායමක් රැස්කරගනු ලැබ ඇති අවස්ථාවක,

එලෙස රැස්කරනු ලබන ආදායමෙන් සියයට දොළහයි දශම පහක් ද,

(ii) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ පනවනු ලබන දඩ මුදල් මගින් රැස්කරනු ලබන ආදායමෙන් සියයට පහක් ද,

අරමුදලට බැර කළ යුතු ය.

(ඈ) ඉහත සඳහන් ප්‍රතිශතයන් යටතේ උපයාගෙන ඇති ප්‍රමාණයෙන් පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් සකස් කෙට මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව නිලධාරීන් සඳහා දිරි දීමනාව අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(ඉ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඉහත කී යෝජනා ක්‍රමයේ නියමිත කාර්ය පරිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(ඊ) එකී අරමුදලේ බැරට ඇති මුදලින් අදාළ නිලධාරීන්ට ගෙවිය යුතු දිරි දීමනා කිනම් මුලධර්මයන් සහ කොන්දේසිවලට යටත්ව ගෙවිය යුතු ද යන්න පිළිබඳව වන රෙගුලාසි, මුදල් ඇමතිවරයාගේ අනුමැතියට යටත්ව කොමසාරිස් විසින් සකස් කළ යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්

(උ) මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව පහත සඳහන් මුදල් සහ දීමනා අරමුදලින් ගෙවිය යුතු ය.

(i) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය වන මුදල් ;

(ii) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් සඳහා සමූහ දිරිගැන්වීමේ දීමනා.

(ඌ) මුදල් වර්ෂයන් අවසානයේදී අදාළ නිලධාරීන්ට ගෙවිය යුතු දිරිදීමනා ගෙවීමෙන් පසුව එකී අරමුදල් බැරට යම් ශේෂයක් වේ නම්, එකී මුදල පළාත් අරමුදලට බැර කළ යුතුයි.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

03. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

10 - 307

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.